අඟුරුවාතොට ඌරුතුඩාව ප්‍රදේශයේ පදිංචි වී සිටි 24 හැවිරිදි මවක් සහ බිලිඳු දියණිය අතුරුදන්වීමේ පුවතේ පසු සිදුවීම් මාධ්‍ය ඔස්සේ අනාවරණය විණි. ඒ අනුව, එම කාන්තාවගේ සහ බිළිඳියගේ මළ සිරුරු සොයා ගැනීමත්, මෙය මනුෂ්‍ය ඝාතනයක් බවට අනාවරණය වීමත්, එම ඝාතනයේ සැකකරු හඳුනාගැනීමත් ජූලි 23 හා 24, 2023 දිනයන්හි පුවත්පත් ඔස්සේ වාතර්‍ා වී තිබිණි.

කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් වාතර්‍ා කළ, ඇතැම් පුවත් වාතර්‍ාවන්හි මෙම මියගිය කාන්තාව සම්බන්ධයෙන් සඳහන් කෙරී තිබුණේ, "රූමත්", "හැඩකාර" වැනි විශේෂණ පද යොදා ගනිමිනි.

ඔබ සිතන ලෙසට,

1) ඝාතනයට ලක්වූ කාන්තාවගේ බාහිර රූපය, මෙම සිදුවීමට සහ පුවතට කෙතරම් අදාළ වන්නේ ද?

2) අදාළ නොවේ යැයි ඔබ සිතන්නේ නම්, එසේ අදාළ නොවන කාන්තා බාහිර රූපය මෙම පුවත් වාතර්‍ා වන තුළ ඉස්මතු කොට දක්වා ඇත්තේ, මෙම පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා දීමට ද? එසේ නම් එවැනි වාතර්‍ාකරණයන් අනුමත කල හැකිද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර්‍ කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!